| මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | |
|---|---|---|
| පළමු වාර පරීක්ෂණය - 2018 | | |
| නර්තනය | 12 ශ්‍රේණිය | කාලය පැය දෙකකි |

- **1 සිට 20 දක්වා ප්‍රශ්න සියල්ලටම වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) උඩරට නර්තන ආධුනික ශිල්පියා නර්තනයට අවශ්‍ය පරිදි පාද හුරුකර ගැනීම සඳහා පා සරඹ නටන අතර ඊට සමානව සබරගමු ආධුනික ශිල්පියා නටනු ලබන්නේ,

I. දොඹින පදය
IV. ඉලංගම් පදය
II. මාත්‍රා පදය
V. සරල පදය
III. මණ්ඩි පදය

2) සාම්ප්‍රදායික භේදයකින් තෝරව පැනීම් හා කැරකීම් පිළිබඳ ප්‍රායෝගික අභ්‍යාසයන්ගේ ශක්‍යතා වර්ධනය සිදු වූ විට ලැබෙනුයේ,

I. ශිල්පීය ප්‍රවීණත්වයයි
IV. මානසික ස්ථූල භාවයයි
II. ශිල්පීය නොහැකියාවයි
V. ශරීර සුබ නම්‍ය නොවීමයි
III. රසඥතා වර්ධනයයි

3) ''කඩතරිකිට කුන්දං කඩතක' ............................ මෙය.

I. දොං ජිංත ගත දොංත වට්ටමේ 2 වන අඩව්වයි.
II. කුඳුංත ගත දෙංත වට්ටමේ 3 වන අඩව්වයි.
III. දොං ජිංත ගත දොංත වට්ටමේ 4 වන අඩව්වයි.
IV. කුඳුංත ගත දෙංත වට්ටමේ 4 වන අඩව්වයි.
V. දොං ජිංත ගත දොංත වට්ටමේ 1 වන අඩව්වයි.

4) මහනුවර දළදා මාළිගාවේ දළදා පෙරහැර මංගල්‍යය අවසානයේ විෂ්ණු දේවාලය හා සම්බන්ධ පවත්වනු ලබන ශාන්තිකර්මය වනුයේ,

I. උඩරට කොහොඹ කංකාරි ශාන්තිකර්මය
IV. සබරගමු වලියක් මංගල්‍ය ශාන්තිකර්මය
II. උඩරට වලියක් මංගල්‍ය ශාන්තිකර්මය
V. උඩරට කඩවර කංකාරි ශාන්තිකර්මය
III. පහතරට වලියක් මංගල්‍ය ශාන්තිකර්මය

5) ගැට බෙරයෙන් වාදනය කරනු ලබන 4 වන බෙර සරඹය වනුයේ,

I. තත් තක්කඩ ජිත් ජික්කඩ
IV. තකට තකට කුද තක්කඩ තඩ කුද
II. කිට තරිකිට තිට තක්කඩ තරිකිට
V. තකට තකට කුද තකට කුජිං ජිං
III. තරිගු තකට දිරිගු තකට

6) අක්ක ඉතිං නාඩන්නේ - එක්ව ගොසින් අප එන්නේ...... මෙය,

I. මඩුපුරයේ ගායනයකි
IV. කොහොඹ හැල්ලේ ගායනයකි
II. රටයකුමේ ගායනයකි
V. අස්නෙ ගායනයකි
III. ග්‍රහපන්ති ගායනයකි

- **අංක 7 සිට 20 දක්වා ප්‍රශ්නවලට වඩාත් සුදුසු පිළිතුර ලියන්න.**

7) අතෝරකරුවෙකුගේ ආධාර ඇතිව විවිධ තාලරූප පදනම් කරගෙන කංකාරියේදී ………………..........…….. නටනු ලැබේ.

8) ආධුනික ශිල්පියෙකුට බෙර වාදනයේදී ...................................… නිවැරදිව වාදනය කිරීමෙන් වාදන හැකියාව වර්ධනය කරගත හැකිය.

9) කිතුල් පතක් භාවිතා කරමින් හඬ සුසර කර ගනු ලබන්නේ ………............………..වාදන භාණ්ඩයේය.

10) අංග රචනයේදී මුහුණට ප්‍රථමයෙන් ආලේපනය කරනු ලබන්නේ ……………………………ආලේපනය.

11) කුජිං ගත්තත් තකුජිං ගත්තත් කුංජිං ගත්තකුදං මෙම පදය මාත්‍රා ……………...…. කාල රූපයට නර්තනය කරනු ලැබේ.

12) කරදිය හා නලදමයන්ති මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ ආචාර්ය ………………………………… ශ්‍රීන්ය.

13) මාලක්කම, බඹර වළල්ල, පතහ විස්ස වැනි පැනීම් හා කැරකීම් දේශිය නර්තන සම්ප්‍රදායන් අතර …………………………………………. නර්තන සම්ප්‍රදායේ භාවිත කරනු ලැබේ.

14) වංගෙඩිය වඩා ඉතාමත් හාස්‍ය ලෙස නැටීම හා සැම චරිතයක්ම පිරිමින් විසින් රගපෑම දක්නට ලැබෙන්නේ ……………………………………. ගැමි නාට්‍යයේදීය.

15) අත්මිණිය හා පන්දම අතැතිව කවි ගායනා කරමින් රංගනයේ ……………………………….. ශාන්තිකර්මයේදීය.

16) වලියක් මංගල්‍යය ………………………………….. හා …………................................... යන නම් වලින් හඳුන්වයි.

17) වාදනය සඳහා මුහුණත් දෙකකින් යුක්තව නිර්මාණය වී ඇති තම්මැට්ටමේ ප්‍රධාන කොටස් 2 කි ………………………… හා ……………………………

18) නාට්‍ය ශාස්ත්‍රය හා අභිනව දර්පනය යන ග්‍රන්ථ දෙක රචනා කළ භාරතීය පඬිවරු දෙදෙනා වන්නේ ……………………….. හා ………………………..

19) මුල් මාත්‍රය හා සුද්ධ මාත්‍රය යන නර්තන අංග දෙක අයත් සම්ප්‍රධායන් වන්නේ ……………………… හා ……………………………………………. .

20) කවි පදය බෙර පදයක ඇදෙන අක්ෂර හා නොඇදෙන අක්ෂර …………………………………….. මාත්‍රා හා ………………………………………. මාත්‍රා යනුවෙන් හැඳින්වේ.

**(I කොටස : ලකුණු 2 x 20 = 40)**

## II කොටස

- **තෝරාගත් ප්‍රශ්ණ 4 කට පිළිතුරු සපයන්න**

1) නිවැරදිව ප්‍රස්ථාර කරන්න.

I. මාත්‍රා 2 + 2 + 2 + 4 + 4 තාල රූපයට අදල බෙර පදයක් **(ලකුණු 3)**

II. මාත්‍රා 3 + 3 තාල රූපයට නානුමුර කවියක පද 2 ක් **(ලකුණු 6)**

III. මාත්‍රා 2 + 3 තාලයට දොං ජිංත ගත දොංත වට්ටමේ අඩව්වක් **(ලකුණු 6)**

2) ගායන වාදන අවස්ථා වලදී විවිධ දේශීය අවනද්ධ භාණ්ඩ යොදගනී.

I. ඔබ ඉගෙනගත් අවනද්ධ භාණ්ඩ 4 ක් නම් කරන්න. **(ලකුණු 5)**

II. ඉන් එක් භාණ්ඩයක රූප සටහනක් ඇඳ කොටස් 4 ක් නම් කරන්න. **(ලකුණු 5)**

III. ඉහත රූප සටහනේ භාණ්ඩය සකස් කර ගැනීම සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය හා එය සකස් කර ගන්නා පිළිවෙල විස්තර කරන්න. **(ලකුණු 5)**

3) දේශිය ශාන්තිකර්ම අතරින් උඩරට සම්ප්‍රදයේ එන වලියක් මංගල්‍ය ශාන්තිකර්මය සුවිශේෂ වේ.

I. වලියක් මංගල්‍ය ශාන්ති කර්මය පැවැත්වීමේ අරමුණු කෙටියෙන් දක්වන්න. **(ලකුණු 5)**

II. මෙම ශාන්තිකර්මයේදී භාවිතා කරන රංගවස්ත්‍ර හා සැරසිලි පිළිබඳව සරල විග්‍රහයක් කරන්න. **(ලකුණු 5)**

III. වලියක් මංගල්‍යය හා සබැඳි පුරාවෘත්තය කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 5)**

4) පහත සඳහන් ගායනා වර්ග කෙටියෙන් හඳුන්වා ඊට අදාල එක් කවිය බැගින් ලියන්න.

I. මඩුපුරයේ කවි

II. ග්‍රහපන්ති කවි

III. රටයකුමේ නානුමුරයේ කවි **(ලකුණු 5 x 3 = 15)**

5) දේශීය නර්තන කලාවේ ආරම්භය හා විකාශය පිළිබද ඓතිහාසික තොරතුරු යුග වශයෙන් හමු වී තිබේ.

I. අනුරාධපුර යුගයේ නර්තන කලාව පැවති බවට තිබු සාධක 2 ක් දක්වන්න.

II. පොළොන්නරු යුගයේ නර්තන කලාව සඳහා භාරතීය ආභාසය ලැබු බවට සාධක 2 ක් දක්වන්න.

III. දඹදෙනි යුගයේ නර්තන කලාව තිබු බවට සාහිත්‍ය කෘති ඇසුරින් සාධක 2 ක් දක්වන්න.

**(ලකුණු 5 x 3 = 15)**

**(II කොටස : ලකුණු 15 x 4 = 60)**